පළාත්අධHdපනදෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල

විෂය :- පෙරදිග සංගීතය

සතිය- 02

fY%Aණිය 10

Prepared by- H.D.V.K.C. Ilangarathna.
(Mu.Teacher. Gonagala North K.V.)

**නිපුණතා මට්ටම:- 5.1** උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණ වල රාගධාරී පසුබිම සාකච්ඡා කරමින් රසවිඳිමින් ගීත ගායනය කරයි.

⋆පහත දැක්වෙන්නේ උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණ වලට රාගධාරීසංගීතය යොදාගත් අවස්ථාවන් කිහිපයක් ඇතුලත් වගුවකි. එය කියවා පහත ක්‍රියාකාරකම කරන්න.

| චිත්‍රපටයේ නම | සංගීත නිර්මාණකරු | තෝරාගත් ගීතය | පදනම් වූ රාගය | ගායනය |
|---|---|---|---|---|
| බෛජු බව්රා (1952) | නෞෂාඩ් | තු ගංගා කී මෝජුමෙ | භෛරවී රාගය | මොහොමඩ් රාෆි |
| බෛජු බව්රා (1952) | නෞෂාඩ් | හෝදුනියා කේ රබ වාලේ | දර්බාරි බාණඩාරාගය | මොහොමඩ් රාෆි |
| පාකීෂා (1972) | ගුලාම් මොහොමඩ් | මෝසම්හෙ | යමන්රාගය | ලතා මංගේෂ්කාර් |
| අභිමාන්( 1973) | සචින් දේව් බර්මන් | තෙරේ මේරේ මිලනකී | බමාජ්රාගය | කිෂෝර් කුමාර් / ලතා මංගේෂ්කාර් |
| සංගම් (1964) | ශංකර් ජායිකිෂන් | මේරේ මන්කී ගංගා | භෛරවීරාගය | මුකේෂ් |
| ජනක් ජනක් පායල් භාජේ (1955) | වසන්ත දේසායි | ජනක ජනක පායල භාජේ | අඩානාරාගය | උස්තාද් අමීර්ඛාන් |

★බොහෝ රාගධාරී චිත්‍රපට ගීත නිර්මාණය කර ඇත්තේ 1950 දශකයේ හින්දි චිත්‍රපට සංගීතය තුළ ය. අදාල ගීතය තුළ ආශ්‍රය කරගත් රාගයේ විශේෂ ස්වර සංගති හා රාගයේ විශේෂ ලක්ෂණ ඇතුලත් කොට නිර්මාණය කිරීම දක්නට ලැබේ. මෙම ගීත ශ්‍රවණය කිරීම තුළින් රාග භාවයන් , රාග ලක්ෂණ හඳුනා ගැනීම මෙන් ම ශාස්ත්‍රීය සංගීතය පිළිබඳ ඇල්මක් ඇතිවේ.

<u>ක්‍රියාකාරකම</u>

1. රාගධාරී සංගීතය ඇතුළත් කොට ගීත නිර්මාණය කළ චිත්‍රපට 03ක් නම් කරන්න.

2.මෝසම්හෙගීතය නිර්මාණයට පාදක කරගත් රාගය කුමක්ද?

3. තෙරේ මේරේ මිලනකී ගීතය නිර්මාණයට පාදක කරගත් රාගය කුමක්ද?

4. භෛරවී රාගය ඇසුරු කරමින් නිර්මාණය කළ චිත්‍රපට ගීත 02ක් නම් කරන්න.

5. පහත වෙබ් අඩවි ඔස්සේ හාyoutube මාර්ගයෙන් රාගධාරී චිත්‍රපට ගීත රසවිඳින්න.
http://www.indiapicks.com/SNT_Hindi/Raga_Index.htm

http://hindigeetmala.net/movie/......htm

6.භෛරවී රාගය ඇසුරු කරමින් නිර්මාණය කළ චිත්‍රපට ගීත 02රසවිඳීමෙන් පසුව ඔබ උගත් භෛරවී සර්ගම් හා මධ්‍යලය ගීතය ගායනය කරන්න.

7. ඉහත චිත්‍රපට ගීත වලින් ඔබ කැමති චිත්‍රපට ගීතයක් ගායනය කරමින් ප්‍රායෝගිකව පුහුණුවන්න.